මගේ අංකය : DMS/CM/පොදු 01
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

2007.10.15 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් /
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් /
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

## රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය සහ අයවැය ඇස්තමේන්තුවල අන්තර්ගත සංවර්ධන ව්‍යාපෘතීන්හි අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු

01. 2007.08.01 වැනි දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 36 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ඉහත චක්‍රලේඛය මගින් නියම කර ඇති කොන්දේසි යටතේ රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට/පත් කිරීමට දුන් අනුමැතිය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 හි PL වැටුප් පරිමාණ හිමි තනතුරු පුරප්පාඩු සඳහා ද අදාල කරගත හැකිය.

* තනතුරු මුදල් රෙගුලාසි 71 යටතේ අනුමතව තිබුණද එම තනතුරු සඳහා බඳවා ගැනීම අත්‍යාවශ්‍ය බව අමාත්‍යාංශ ලේකම් පෞද්ගලිකව සෑහීමකට පත් විය යුතුය.

* එසේ බඳවාගත හැක්කේ 2006.06.30 දිනට හෝ ඊට පසුව විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම, මිය යාම හෝ සේවය අත හැරයාම නිසා ඇති වූ පුරප්පාඩු සඳහා පමණි.

* රාජ්‍ය අංශයේ වර්තන වියදම් නිසි පාලනයකට යටත් විය යුතු බැවින් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ දී / පත් කිරීමේ දී ඒ සඳහා අනිවාර්යයෙන් දැරීමට සිදුවන වියදම ද සලකා, එමගින් ඇතිවන සේවා ඵලදායිතාවය වියදමට වඩා වැඩි බව සනාථ කිරීමටත් වගබලා ගතයුතුය.

03. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 36 හි සඳහන් අනෙකුත් විධිවිධාන තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
6. විගණකාධිපති
7. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
8. ලේකම්, මුදල් කොමිෂන් සභාව

} දැනගැනීම සඳහා